ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கைச் சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Act No.13 of 1957
Reg.by Boy Scout International Bureau on -22.02.1953

**2026.02.10** ***චක්‍රලේඛ අංක : 11 /2026***

**සියලුම දිසා කොමසාරිස්වරුන් හා සහාය දිසා කොමසාරිස් (පුහුණු) වෙත,**

## <u>කඳවුරු ගිණිමැල නායක පාඨමාලාව</u>
## <u>2026 මාර්තු මස 06 සිට 08 දක්වා</u>

උක්ත පාඨමාලාව **2026** මාර්තු මස **06** වන දින පෙ.ව. **09.00** සිට **08** වන දින ප.ව. **02.30** දක්වා මීරිගම ලී දසනායක බාලදක්ෂ පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වීමට කටයුතු සුදානම් කර ඇත.

මෙම පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය මගින් පවත්වන ලද බාලදක්ෂ නායක IV අදියර උසස් පාඨමාලාවක් සාර්ථකව හැදෑරූ බලපත්‍රලාභී බාලදක්ෂ නායක නායිකාවන් හා ඉන් ඉහළ පුහුණුවක් ලැබූ නායක නායිකාවන් සහභාගී කළ හැක. **(2025** වසරට බලපත්‍රය නවීකරණය කර හෝ නව බලපත්‍රයක් ලබා තිබිය යුතුයි.**)**

***රැගෙන ආ යුතු දේ :-***

i. සම්පූර්ණ බාලදක්ෂ නිල ඇඳුම
ii. ගිල්වෙල් කර ලේන්සුව
iii. දින දෙකක් නේවාසික වීම සඳහා ඇඳුම් පැළඳුම් හා උපකරණ
iv. සංගීත භාණ්ඩයක්
v. සටහන් තබා ගැනීමට පොතක් හා පෑනක්
vi. පිඟානක් හා කෝප්පයක්
vii. ගිණිමැල ලෝගුව (තිබේ නම් පමණක්)

පාඨමාලා ගාස්තුව රු. **3500/-** කි.

ඔබ දිසාවේ පසුගිය වසර කිහිපය තුළ කඳවුරු ගිණිමැල සඳහා නායකත්වය දක්වමින් ගායනය/රංගනය/නායකත්වය යන ගුණාංගයන්ගෙන් පිරිපුන් ඉහත සුදුසුකම් සපුරා ඇති බාලදක්ෂ නායක මහත්ම මහත්මීන් පමණක් මේ සමග අමුණා ඇති අයදුම් පත්‍ර නිසි පරිදි පුරවා **<u>2026 පෙබරවාරි මස 20 වන දිනට පෙර</u>** ***<u>ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්, ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය, අංක. 65/9, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.</u>*** යන ලිපිනයට යොමු කරන්න.
සියලුම සහභාගීවන්නන් සම්පූර්ණ පාඨමාලා කාලය තුළම නේවාසිකව රැඳී සිටිය යුතු අතර, පාඨමාලාව සම්පූර්ණ කරන සැමට සහභාගීවීමේ සහතිකයක් පිරිනැමෙනු ඇත.

පාඨමාලාව සඳහා උපරිම **48** දෙනෙකු පමණක් සහභාගීකරගන්නා බැවින් ඉල්ලුම් පත් නියමිත දිනට පෙර එවීමට කටයුතු කරන්න.

තෝරා ගත් අයදුම්කරුවන්ගේ නාම ලේඛණය ප්‍රකාශයට පත් කල පසු එහි දන්වන ලද දිනට පෙර පාඨමාලා ගාස්තු ගෙවිය යුතුය.

ස්තූතියි.

මෙයට,
බාලදක්ෂ සේවයේ නියුතු,

***කර්නල් පද්මලාල් පෙරේරා***
ජාතික පුහුණු කිරීමේ කොමසාරිස්

***නීතිඥ මනෝජ් නානායක්කාර***
ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්

පිටපත් - ජාතික බාලදක්ෂ මුලස්ථානයේ සියළුම කොමසාරිස්වරුන්
සභාපති, විධායක සභා සභාපති, ගරු ලේකම් හා ගරු භාණ්ඩාගාරික - ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය